# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

8

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 11 ශ්‍රේණිය

## ආයෝජනය

I කොටස :-

1. ආයෝජනය යන්න කෙටියෙන් ලියා දක්වන්න.
2. ආයෝජන මාර්ග 03ක් නම් කරන්න.
3. පුද්ගලයෙකු තම මුදල් ආයෝජනය කිරීමේ දී සලකා බැලකා බැලිය යුතු කරුණු 02ක් සඳහන් කරන්න.
4. පහත සඳහන් ආයෝජන මාර්ග හඳුනාගෙන ඒ එක් එක් ආයෝජන මාර්ගයක් මඟින් ලබා ගත හැකි ප්‍රතිලාභ 02ක් බැගින් ලියන්න.
   - ස්ථාවර තැන්පතු
   - දේපළවල ආයෝජන
5. කොටස් යන්න හඳුන්වන්න.
6. කොළඹ කොටස් වෙළෙඳපොළ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පාර්ලිමේන්තු පනතක් යටතේ පිහිටුවා ඇති ආයතනය කුමක්ද?
7. ආයෝජකයෙකුට සාමාන්‍ය කොටස් මිලට ගැනීම නිසා ලැබෙන ප්‍රතිලාභ කවරේද?
8. සමාගමක් ලාභාංශ ප්‍රකාශ කරන්නේ කුමන අවස්ථාවකදීද?
9. සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා ගැනීමේදී ඡන්ද බලය හිමි වන්නේ කුමන පාර්ශවයකටද?
10. භාණ්ඩාගාර බිල්පතක් යන්න කෙටියෙන් හඳුන්වන්න.
11. රජය වෙනුවෙන් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරන්නේ කවුරුන් විසින්ද?
12. යම් ආයෝජකයෙකුට භාණ්ඩාගාර බිල්පත් මිලට ගත හැකි වන්නේ කවර බැංකුවලින්ද?
13. භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවාද?
14. විශ්‍රාමික රාජ්‍ය සේවකයෙක් වූ මොහාන් සිල්වා මහතා තමා ළඟ ඉතිරි කරගත් මුදල් නිශ්චිත ඉහළ මාසික ආදායමක් ලබා ගත හැකි වන ආකාරයට යම් ආයෝජන මාර්ගයක යෙදවීමට තීරණය කරයි.

    (අ) ඔහුගේ අරමුණ ඉටු කර ගැනීමට සුදුසු සුරක්ෂිත ආයෝජන මාර්ගයක් යෝජනා කරන්න.

    (ආ) එම ආයෝජන මාර්ගය යෝජනා කිරීමට හේතු වූ කරුණු 02ක් ලියන්න.

15. ආයෝජනය පිළිබඳ අවබෝධයක් නැති සතරසිංහ මහතාට තමාගේ විශ්‍රාම යාමෙන් ලැබුණු රු.1 000 000ක මුදල හා ඔහු ඉතිරිකරගෙන තිබූ රු.2 000 000ක මුදල කුමක් සඳහා යොදවන්නේ දැයි කල්පනා කරමින් සිටී.

    ඔහුගේ මිතුරකු වන පෙරේරා මහතා ඔහුට පවසන්නේ මේ දිනවල බැංකු පොළී අනුපාතය ඉහළ මට්ටමක පවතින බැවින් ස්ථාවර තැන්පතුවක් ආරම්භ කරන ලෙසයි. එහෙත් ඔහුගේ බිරිඳ පවසන්නේ මේ දිනවල ඉඩම් හා රත්තරං මිලට ගැනීම තුළින් අනාගතයේ ඒවා විකිණීමෙන් ඉහළ ප්‍රාග්ධන ලාභ ලැබිය හැකි බවයි.

    1) මෙම සිද්ධියෙන් මතුවන ආයෝජන මාර්ග 02ක් නම් කරන්න.
    2) එම එක් එක් ආයෝජන මාර්ගවල ප්‍රතිලාභ 02 බැගින් ලියා දක්වන්න.
    3) සතරසිංහ මහතාට මුදල් ආයෝජනය කළ හැකි තවත් ආයෝජන මාර්ග නම් කරන්න.
    4) සිද්ධියට අනුව ප්‍රාග්ධන ලාභ යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

16. වෙනත් ආයෝජනයන්ට සාපේක්ෂව දේපළ හෝ වත්කම්වල ආයෝජනය කිරීම පහසු කටයුත්තකි. ඉඩම් හා නිවාසවල මෙන්ම ස්වර්ණාභරණවල මිල දිනෙන් දින ඉහළ යාම ඊට හේතුවයි. ඒ තුළින් ප්‍රාග්ධන ලාභ ලැබීමේ අවස්ථාව වැඩි වී ඇත. එමෙන්ම මෙම ආයෝජනයන්හි අවාසි සහගත තත්ත්වයන් ද දක්නට ඇත. එනම් වෙනත් ආයෝජන යටතේ ලබා ගැනීමට හැකි පොළී ආදායම් ඉපයීමට ඉඩක් නොමැති වීමත්, දේපළ විකුණා මුදල් ලබා ගැනීමට යම් කාලයක් බලා සිටීමට සිදු වීමත් ඒ අතර වේ. එමෙන්ම මෙම වත්කම්හි ආයෝජනය කිරීමට විශාල මුදල් ප්‍රමාණයක් ද අවශ්‍ය වේ. නමුත් කුඩා මුදලකින් ඉතුරු ගිණුම්වල ආයෝජනය කළ හැකිය. ඒ නිසා ඉහළ මුදල් ප්‍රමාණයක් ඇති අයට මෙම ආයෝජන මාර්ග වඩාත් සුදුසු වේ.

1) සිද්ධියට අදාළව කියවෙන ආයෝජන මාර්ගය කෙටියෙන් හඳුන්වන්න.
2) මෙම ආයෝජන මාර්ගය තෝරා ගැනීමෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවාද?
3) මෙවැනි ආයෝජනයක් කිරීම නිසා දැරීමට සිදු විය හැකි වියදම් පෙළ ගස්වන්න.

**II කොටස :-**

**බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1. ආයෝජනයට සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

   1) ආයෝජනයක අවදානම වැඩිවන විට එහි ප්‍රතිලාභය අඩුවෙයි.
   2) කොටස් වෙළෙඳපොළ ආයෝජනයෙන් ඉහළ පොළී ආදායමක් ලබා ගත හැකිය
   3) ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම ආයෝජන මාර්ගයක් ලෙස නොසැලකේ.
   4) අරමුදල් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායී මාර්ගයක යෙදවීම ආයෝජනයයි.

2. ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු ප්‍රධානතම සාධක 02ක් වන්නේ,
   1) අවදානම හා ප්‍රතිලාභය.
   2) අවදානම හා පහසුවය.
   3) ප්‍රතිලාභය හා ඇපසුරැකුම්ය.
   4) පහසුව හා ප්‍රතිලාභයයි.

3. ආයෝජකයෙකුට සමාගමක කොටස් මිලදී ගැනීමටත්, අවශ්‍ය විට නැවත විකිණීමටත් නිර්මාණය වූ වෙළෙඳපොළ කුමක්ද?

   1) විවෘත වෙළෙඳපොළ
   2) තොග වෙළෙඳපොළ
   3) කොටස් වෙළෙඳපොළ
   4) ආයෝජන වෙළෙඳපොළ

4. පහත දැක්වෙන ඒවා අතුරෙන් අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධතාවය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
   1) ප්‍රතිලාභය ඉහළය, අවදානම ඉහළය
   2) ප්‍රතිලාභය ඉහළය, අවදානම පහළය
   3) ප්‍රතිලාභය පහළය, අවදානම ඉහළය
   4) ප්‍රතිලාභය නැත, අවදානම ඉහළය

5. පහත සඳහන් ආයෝජන මාර්ග අතුරෙන් පූර්ණ රාජ්‍ය ආරක්ෂාව හිමි ආයෝජන මාර්ගය කුමක්ද?

   1) ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම.
   2) දේපළ මිලදී ගැනීම.
   3) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම.
   4) සාමාන්‍ය කොටස් මිලදී ගැනීම.



ව්‍යවසායකත්ව හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

6. ඉතිරි කිරීමේ ගිණුමක මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභයක් වන්නේ,

1) චෙක්පත් මඟින් ගනුදෙනු කිරීමේ හැකියාව.
2) ස්ථාවර තැන්පතුවකට සාපේක්ෂව ඉහළ පොළී ආදායමක් ලැබීම.
3) ලාභාංශ ආදායම් ලැබීම.
4) ත්‍යාග හෝ ලොතරැයි දිනුම් ඇදීම ආදිය මඟින් අමතර ප්‍රතිලාභ ලැබීම.

7. ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

1) සුරක්ෂිත ආයෝජන මාර්ගයක් වීම.
2) තැන්පතු සහතිකයක් හිමි වේ.
3) තැන්පතු සහතිකය ඇපයට තබා ණය මුදලක් ගත නොහැකි වීම.
4) සාපේක්ෂව ඉහළ පොළී අනුපාතයක් හිමි වීම.

8. මැණික් ගලක් විකුණා රු.2 000 000ක ආදායමක් ලැබූ සුරේන් එම මුදල මාස හයක කාලයකට ආයෝජනය කිරීමට බලාපොරොත්තු වේ. ඒ සඳහා විධිමත් ආයෝජනය වන්නේ,

1) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමය.
2) වාහනයක් මිලදී ගැනීමය.
3) ඉඩම් මිලදී ගැනීමය.
4) ස්වර්ණාභරණ මිලදී ගැනීමය.

9. යම් ආයෝජකයෙකුට භාණ්ඩාගාර බිල්පත් මිලට ගත හැක්කේ,

1) කොටස් වෙළෙඳපොළ මඟින්ය.
2) ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මඟින්ය.
3) බලපත්‍රලාභී වාණිජ බැංකු මඟින්ය.
4) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව මඟින්ය.

10. වර්ෂයකට අඩු කාලයක් සඳහා මුදල් ආයෝජනය කිරීම සඳහා සුදුසු මූල්‍ය උපකරණය තෝරන්න.

1) සමාගම් කොටස්
2) සමාගම් ණයකර
3) භාණ්ඩාගාර බැඳුම්කර
4) භාණ්ඩාගාර බිල්පත්

11. දේපළ මිලදී ගැනීම සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

1) ණය මුදලක් ලබා ගැනීමේදී ඇප සුරකුම් ලෙස ඉදිරිපත් කළ නොහැකි වීම.
2) ප්‍රාග්ධන ලාභ ඉපැයීමේ හැකියාව ලැබීම.
3) ස්ථාවර වත්කම් හිමිකරුවකු වීම.
4) දේපළ විකුණා මුදල් ලබා ගත හැකි වීම.

12. සමාගමක කොටස් ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභයකි.

1) ප්‍රාග්ධන ලාභ ලැබීම.
2) පොළී ලැබීම.
3) ස්ථිර ලාභාංශයක් ලැබීම.
4) සම්මුචිත ලාභාංශ ලැබීම.

13. කොටස්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභයක් නොවන්නේ,

1) ප්‍රාග්ධන ලාභ ලැබීම.
2) ලාභාංශ ලැබීම.
3) පොළී ලැබීම.
4) ඇප සුරැකුමක් ලෙස ඉදිරිපත් කළ හැකි වීම

14. ආයෝජකයෙකු රු.100 බැගින් කොටස් මිලට ගෙන, නැවත එම කොටසක් රු.110 බැගින් විකුණා ප්‍රතිලාභයක් ලැබීය. මෙම ප්‍රතිලාභය හඳුන්වන්නේ,

1) ප්‍රාග්ධන ලාභ ලෙසය.
2) ලාභාංශ ලෙසය.
3) පොළී ආදායම් ලෙසය.
4) විකුණුම් මිල ලෙසය.

15. කොළඹ කොටස් වෙළෙඳපොළ කටයුතු මෙහෙය වන්නේ,

1) ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව මගිනි.
2) ශ්‍රී ලංකා මහ බැංකුව විසිනි.
3) බලපත්‍රලාභී වාණිජ බැංකු විසිනි.
4) කොළඹ කොටස් හුවමාරුව විසිනි.

16. කොළඹ කොටස් වෙළෙඳපොළ කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ,

1) ශ්‍රී ලංකා මහ බැංකුව විසිනි.
2) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසිනි.
3) කොළඹ කොටස් තැරැව්කරුවන්ගේ සංගමය විසිනි.
4) ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව විසිනි.

17. ලාභාංශ ආදායමක් ලැබෙන ආයෝජන මාර්ගය වන්නේ,

1) සාමාන්‍ය කොටස් මිලදී ගැනීමය.
2) ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීමය.
3) ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීමය.
4) ස්වර්ණාභරණ මිලදී ගැනීමය.

18. ආයෝජන සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.

1) ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීමෙන් කල් පිරුණු පසු අදාල තැන්පතු මුදල හා පොළිය යන දෙකම ලැබේ.
2) දේපළ හා ස්වර්ණාභරණ මිලට ගැනීමෙන් ප්‍රාග්ධන ලාභ ලැබිය හැකි වේ.
3) සාමාන්‍ය කොටස් මිලටගැනීමෙන් එය සුරැකුමක් ලෙස ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.
4) භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් රජයේ දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා සපුරා ගත හැකිය.

19. ඔබ ළඟ ඇති රු.1 000 000 මුදල ආයෝජනය කළ හැකි අවදානම් අඩුම මාර්ගය වන්නේ,

1) භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීමය.
2) බැංකුවක ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීමය.
3) තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමය.
4) කොටස් වෙළෙඳපොළ ආයෝජනය කිරීමය.

20. සාමාන්‍ය කොටස්වල ආයෝජනය කළ ආයෝජකයෙකුට ලැබෙන වාසියක් නොවන්නේ,
    1) ඡන්දය භාවිතා කර අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමේ හැකියාව.
    2) අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම මඟින් සමාගමේ තීරණ ගැනීමට දායක වීම.
    3) ආයෝජනය සඳහා පූර්ණ රාජ්‍ය ආරක්ෂාව ලබා ගැනීමට හැකිවීම.
    4) ඕනෑම අවස්ථාවක සාමාන්‍ය කොටස් අලෙවිකර මුදල් ලබා ගැනීමට හැකි වීම.

**III කොටස :-**

**පහත සඳහන් ප්‍රකාශ සත්‍ය නම් (✓) ලකුණ ද අසත්‍ය නම් (×) ලකුණ ද යොදන්න.**

1. ආයෝජනයක අවදානම ඉහළ යන විට ඉන් ලැබෙන ප්‍රතිලාභය පහළ යයි. (........)
2. සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශ හිමි නොවේ. (........)
3. ඉතිරි කිරීමේ තැන්පතු සඳහා ස්ථාවර තැන්පතුවලට වඩා වැඩි පොළියක් හිමි වේ. (........)
4. සී/ස සමාගමක් මූල්‍ය සම්පාදනය කරන එකම මාර්ගය කොටස් නිකුත් කිරීම වේ. (........)
5. සුදුසු ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී ආයෝජනයෙහි අරමුණ පිළිබඳ සලකා බලනු ලැබේ. (........)
6. පුද්ගලයෙකු ආයෝජනය තුළින් දරණ අවදානමට අදාළව සාධාරණ ප්‍රතිලාභයක් අපේක්ෂා කරයි. (........)
7. තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම සුදුසු ආයෝජන මාර්ගයකි. (........)
8. ඉතුරුම් තැන්පතු සඳහා පොළී ආදායමක් හිමි නොවේ. (........)
9. ස්ථාවර තැන්පතුවක මුදල් ආයෝජනය කිරීම සුරක්ෂිත ආයෝජන මාර්ගයක් නොවේ. (........)
10. වාහන හෝ නිවාස මිලට ගැනීම ඵලදායී ආයෝජන මාර්ගයක් වේ. (........)
11. දේපළ කුළියට හෝ බද්දට දීමෙන් හෝ ආදායම් ඉපැයිය හැකි වේ. (........)
12. පොළී ආදායම් ලැබීම කොටස්වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභයකි. (........)
13. සමාගමක් විසින් විවිධ වර්ගවල කොටස් නිකුත් කරනු ලබයි. (........)
14. සංස්ථාපිත සමාගමක සාමාන්‍ය කොටස් මිලදී ගත් ඕනෑම පුද්ගලයෙක් හෝ ආයතනයක එම සමාගමේ අයිතිකරුවකු වේ. (........)
15. රජයේ දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි. (........)
16. කොළඹ කොටස් වෙළෙඳපොළ කටයුතු අධීක්ෂණය හා විධිමත් කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුව පිහිටුවා ඇත. (........)
17. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සිදු කරන්නේ ලියාපදිංචි ද්විතියික වෙළෙඳුන් මඟිනි. (........)
18. භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය මඟින් සමාගමක හිමිකරුවකු බවට පත්විය හැකිය. (........)
19. භාණ්ඩාගාර බිල්පත් වර්ෂයක් හෝ ඊට අඩු කාලයක දී කල් පිරේ. (........)
20. ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ කොටස් වෙළෙඳපොළේ ආයෝජකයින් ආරක්ෂා කිරීම සඳහා එය විධිමත්ව හා සාධාරණව පවත්වාගෙන යාම වේ. (........)